සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
**மூன்றாம் தவணைப் பரீட்சை - 2026**
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } **13** | විෂයය / பாடம் / Subject } **නර්තනය (දේශීය)** | පත්‍රය / வினாத்தாள் / Paper } **I** | පැය / மணித்தியாலம் / Hours } **2** |

**උපදෙස් :**
ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතුයි.
එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා ඒට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

1. "බුද්ධ රාජය වැන්දේ පළමුව" මෙම කවිය 2+2+2+4+4 තාල රූපයට ගායනය කිරීමේදී වාදනය කරනු ලබන බෙර පදය වනුයේ,
   (1) දොං දොං ජිං ජිං ගජි ගත
   (2) දොං තකු දොං ජිං තක තරිකිට
   (3) දොං තකුං දොං තකුං දොං දොං
   (4) දොං තකුදත් ගජිංත ගජිතකුදත් ගජිංත
   (5) දොංත කුං දොං තකුං දොංතකු (---------)

2. කිරිමැස්ස සකස් කිරීමේදී විශේෂයෙන් යොදාගනු ලබනනේ,
   (1) කදුරුගස්, කදුරුඅතු, නුගඅතු
   (2) කොස් අතු, බුරුල්ල අතු, කෙසෙල් අතු
   (3) ගොප් අතු, බුරුල්ලා අතු, නුගඅතු
   (4) පුවක් ගස්, ඇට්ටේරියා අතු, කරද අතු
   (5) කොස් අතු, බුරුල්ල අතු, කරද අතු (---------)

3. "ලකල පුළුලුකුල බඳමිණි මෙවුල්ලා" කවි පාදය ඇතුළත් සංදේශ කාව්‍ය වන්නේ,
   (1) පරවි (2) සැළලිහිණි
   (3) කෝකිල (4) මයූර
   (5) තිසර (---------)

4. වෙස් මුහුණුවල දක්නට ලැබෙන්නේ,
   (1) ශෛලීගත අංග රචනයකි. (2) විකාර රූපී අංග රචනයකි.
   (3) ස්වභාවික අංග රචනයකි. (4) තාත්වික අංගරචනයකි.
   (5) ස්ථාවර අංග රචනයකි. (---------)

5. තාල රූපයක් නිර්මාණය වීම සඳහා අවශ්‍ය මූලධර්ම ඇතුළත් වරණය තෝරන්න.

(1) ගති, විභාග, ආඝාත, ආවර්ත සහ ලය
(2) ජති, ගති, ලය, ආඝාත සහ තාල
(3) ජති, ගති, ලය, ආඝාත සහ මිති
(4) ආඝාත,ගති,ජති,මිති, සහ ලය
(5) ගති, විභාග, තාල ආඝාත සහ ලය (---------)

6. චලනයේ ස්වභාවය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක දෙකකි,

(1) වේගය හා ලය
(2) කාලය හා හැඩතල
(3) ශක්තිය හා වේගය
(4) ලය හා කාලය
(5) ශක්තිය හා සිරුර (---------)

7. රන් පැහැය සහ දම් පැහැය හිමි ග්‍රහයන් පිළිවෙළින් සඳහන් වන වරණය කුමක්ද?

(1) අඟහරු සහ බුධ
(2) හිරු සහ සෙනසුරු
(3) සිකුරු සහ කේතු
(4) ගුරු සහ සඳු
(5) ගුරු සහ හිරු (---------)

8. ආලෝකකරණයේ දී සුදු වර්ණයට පමණක් ප්‍රතිචාර දක්වන පහන් විශේෂය කුමක්ද?

(1) අල්ට්‍රා වයලට් පහන
(2) ඩිමරය
(3) ස්ටොබ් පහන
(4) සට්‍රිප් ලාම්පුව
(5) ධාරාලෝක පහන (---------)

9. "බීබත්සාාද්භූත ශාන්තසාය" මෙහි දැක්වෙන රස නිෂ්පත්තියට හේතුවන භාව වන්නේ,

(1) විස්මය, භය, ශම
(2) බීබත්ස්‍ය, භය, ශාන්ත
(3) අද්භූත, ජුගුප්සා, ශම
(4) ජුගුප්සා, අද්භූත, ශම
(5) අද්භූත, හාස, ශාන්ත (---------)

10. "රෙගත දෙගත ගති ගත ගුම්දත් දෙගතම් " බෙර පදයෙන් සභාවට පිවිසෙන්නේ,

(1) කළුයකා
(2) නොංචි
(3) රීරියකා
(4) මුදලි
(5) ලෙන්චිනා (---------)

11. "තාල කාල ක්‍රියා මානම්" යනුවෙන් තාලය අර්ථ දක්වනු ලබන්නේ,

(1) අමරසිංහ ආචාර්යන්ගේ අමරකෝෂය
(2) අභිනව ගුප්ත ආචාරයන්ගේ අභිනව භාරතී
(3) සාරංග දේව පඬිතුමාගේ සංගීත රත්නාකරය
(4) නන්දිකේශ්වරයන්ගේ අභිනය දර්පණය
(5) භරතමුණි පඬිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රය (---------)

12. බණ්ඩ ජාති ඒක තාලය දේශීය තාල ලක්ෂණ අනුව සමාන වන්නේ,

(1) මහ තනි තිත (2) සුළු මහ දෙතිත (3) සුළු මැදුම් දෙතිත

(4) මැදුම් මහ දෙතිත (5) මැදුම් තනිතිත (---------)

13. නක්ෂත්‍ර නියමයන් අනුව බෙර ඇසට හම් එලීම සිදුකරනු ලබන්නේ,

(1) බ්‍රහ්ම යෝගයෙනි. (2) ඉන්ද්‍ර යෝගයෙනි. (3) හෙන යෝගයෙනි.

(4) වජ්‍ර යෝගයෙනි. (5) සිද්ධි යෝගයෙනි. (---------)

14. ආසියාවේ නාට්‍ය හා නර්ථන කලාව සහ සිංහල තිත්තාල ක්‍රමය කෘති කරන ලද්දේ,

(1) එදිරිවීර සරච්චද්‍ර සහ පණ්ඩිත් අමරදේව

(2) කෝට්ටේ ජයසේන සහ පණ්ඩිත් අමරදේව

(3) එදිරිවීර සරච්චන්ද්‍ර හා ලයනල් අල්ගම

(4) මුදියන්සේ දිසානායක සහ පණ්ඩිත් අමරදේව

(5) මුදියන්සේ දිසානායක හා සරත් විජේවර්ධන (---------)

15. හඬ ඉර (අඬ ඉර), කුන්දිරම්පල්ල සහ වලයම යොදාගනු ලබන්නේ පිළිවෙලින්,

(1) ගැටබෙරය, පහතරට බෙරය, උඩැක්කිය

(2) ගැටබෙරය, තම්මැට්ටම, පහතරට බෙරය

(3) තම්මැට්ටම, දවුල, උඩැක්කිය

(4) රබාන, දවුල, ගැටබෙරය

(5) තම්මැට්ටම, ගැටබෙරය, පහතරට බෙරය (---------)

16. නවතම වන්නම් අතර මහබෝ වන්නම රචනා කරන ලද්දේ,

(1) අරිසෙන් අහුබුදු (2) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

(3) මුදියන්සේ දිසානායක (4) ජයසේන කෝට්ටෙගොඩ

(5) ශ්‍රියානි රාජපක්ෂ (---------)

17. බැරිසිල් මුද්‍රා නාට්‍යයේ රංග රචනය සිදු කරන ලද්දේ,

(1) මුදියන්සේ දිසානායක මහතා විසිනි. (2) ජානකිහිල් මහත්මිය විසිනි.

(3) ප්‍රේමකුමාර එපිටවෙල මහතා විසිනි. (4) චිත්‍රසේන ඩයස් මහතා විසිනි.

(5) ආරියරත්න කළුආරච්චි මහතා විසිනි (---------)

18. පිළිවෙලින් ගීත නාට්‍යයක් සහ ශෛලිගත නාට්‍යයක් වනුයේ,

(1) දෙපානෝ සහ සිංහබාහු

(2) වෙරිවත්ත සහ ප්‍රේමතෝජායති ශෝකෝ

(3) කැලණි පාලම සහ මනමේ

(4) ප්‍රේමතෝජායති ශෝකෝ සහ මඟුල් ප්‍රස්ථාව

(5) කැලණි පාලම සහ මඟුල් ප්‍රස්ථාව (---------)

19. කහ වර්ණය සකස් කිරීමේ දී එක් කළ යුතු මූලික වර්ණ දෙක වේ.

(1) කොළ හා නිල් (2) කොළ හා රතු (3) රතු හා සුදු

(4) නිල් සහ කොළ (5) කොළ සහ සුදු (---------)

20. සංස්කෘතික දෙපාර්තමේන්තුව සහ ගාන්ධර්ව විභාගය ආරම්භ කරන ලද්දේ,

(1) 1986 වර්ෂයේ ය. (2) 1972 වර්ෂයේ ය.

(3) 1977 වර්ෂයේ ය. (4) 1956 වර්ෂයේ ය.

(5) 1936 වර්ෂයේ ය. (---------)

21. අරංගේත්‍රම් සංදර්ශනය හතරවන නර්තනාංගය වන්නේ,

(1) වර්ණම් (2) ශබ්දම් (3) පදම්

(4) තිල්ලානා (5) ශ්ලෝකම් (---------)

22. පහත A හා B රූපවල දක්නට ලැබෙන සැරසිලි ඇතුළත් වර්ණය තෝරන්න.





(1) අට මගල සහ මල් යහන (2) කුමාර වීදිය සහ සොලොස්මගල

(3) මල්මඩුව සහ වට කුමාර වීදිය (4) යහන සහ කිරිමැස්ස

(5) සොළොස්මගල සහ සන්නියකුම් වීදිය (---------)

23. අවුරෝරා කුමරිය සහ සිග්ෆ්‍රිඩ් කුමරු චරිත හමුවන බැලේ කෘති දෙක වන්නේ,

(1) හංසවිල සහ ද නට් ක්‍රැකර් (2) නිදිකුමරිය සහ හංසවිල

(3) ද නට් ක්‍රැකර් සහ හංසවිල (4) හංසවිල සහ නිදිකුමරිය

(5) ද නට් ක්‍රැකර් සහ නිදිකුමරිය (---------)

24. ලොව ප්‍රථම ස්ථිර ව ගොඩ නගන ලද එළිමහන් කවාකාර රංග භූමිය වන්නේ,

(1) ග්‍රීසියේ එපිඩෝස් හි පිහිටි රංග භූමිය

(2) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය

(3) රෝම රංග භූමිය

(4) එලිසබීතන් රංගශාලාව

(5) මරදාන ටවර් රඟහල (---------)

25. ශාන්තිකර්ම සැරසිලි ආශ්‍රිත කැටයම් නිර්මාණය කිරීම සඳහා භාවිත අමුද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ,

(1) ගොප්කාළ, බුරුල්ල අතු, සහ රඹ පතුරු

(2) රඹ පතුරු, ගොක් අතු සහ නියැඳ කෙඳි

(3) ගොක්කොළ, පුවක් අතු සහ නියැඳ කෙඳි

(4) තොළඹෝ, හබරල සහ ගොක් කොළ

(5) රඹ පතුරු, ගොප්කොළ සහ හබරල කොළ (--------)

- අංක 26 සිට 35 තෙක් දී ඇති හිතැනට වඩාත් සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

26. ගුරු අක්ෂරයකට අයත් මාත්‍රා ගණන ---------------------------------------------- කි.

27. ඨුම්රි, තරානා යන නර්තනාංග ---------------------------------------------- නර්තන සම්ප්‍රදායට අයත්ය.

28. වලියක් මංගල්‍ය ශාන්ති කර්මය පවත්වනු ලබන්නේ ---------------------------------------------- දේවාලයේ දී ය.

29. "කලුවන් කළුරුවයි මංගෝ දිළිසෙනවා" මෙය ---------------------------------------------- කවියකි.

30. කළු කුමාර බලිය සහ උනුනුපියන යන සැරසිලි ---------------------------------------------- ශාන්තිකර්මයේ අන්තර්ගතය.

31. නිශ්චිත තාල රූපයක වේගය ---------------------------------------------- මානය ලෙස හඳුන්වයි.

32. සිංහල ගැමි නැටුම්වල එන ලී මල්ලියට සමාන ද්‍රවිඩ ගැමි නැටුම ---------------------------------------------- ලෙස හැඳින්විය හැකියි.

33. අලගියවන්න මුකවැටි කවියා විසින් ලියන ලද මුල්ම හටන් කාව්‍ය ---------------------------------------------- හටනයි.

34. අශ්ව කෙඳි අළුවකින් වාදනය කරනු ලබන්නේ ---------------------------------------------- වාද්‍ය භාණ්ඩයයි.

35. කථකලී නර්තනයේ ප්‍රභවයට තුඩු දුන් චක්කියාර්කූථු රඟ දක්වන ලද්දේ ---------------------------------------- විසිනි.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

36. බැලේ රඟ කලාව ඉතාලියේ සිට ප්‍රංශයට ව්‍යාප්ත වීමේ දී ඒ සඳහා මුල් වූ දෙදෙනා නම් කරන්න.

i) ----------------------------------------------

ii) ----------------------------------------------

37. "සියොපත් පතිනේ දිගුණුව නෙතිනේ" මෙහි ලඝු හා ගුරු අක්ෂර ගණන කීයද?

i) ලඝු ----------------------

ii) ගුරු --------------------

38. වෙහෙර විහාරස්ථානවල පන්තේරු නර්තනයේ යොදාගත් අවස්ථා දෙකක් නම් කරන්න.

i) -----------------------------------------------

ii) -----------------------------------------------

39. තම්මැට්ටමේ දකුණු ඇස හා වම් ඇස හඳුන්වන නාම ලියා දක්වන්න.

දකුණු ඇස -----------------------------------------------

වම් ඇස -----------------------------------------------

40. රීරි යකාගේ වර්ණය හා රංග භාණ්ඩය නම් කරන්න.

i) වර්ණය -----------------------------------------------

ii) රංග භාණ්ඩය -----------------------------------------------

41. පහත A හා B රූපවල දැක්වෙන මුද්‍රනාට්‍ය නිර්මාපකයක් නම් කරන්න.



A



B

A -----------------------------------------------

B -----------------------------------------------

42. කහරොටි දානය චාරිත්‍රය අයත් ශාන්තිකර්මය සහ නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

i) ශාන්තිකර්මය -----------------------------------------------

ii) නර්තන සම්ප්‍රදාය -----------------------------------------------

43. නිදි කුමරිය බැලේ කෘතිය නිෂ්පාදිත වර්ෂය හා සංගීතඥයා නම් කරන්න.

i) වර්ෂය -----------------------------------------------

ii) සංගීතඥයා -----------------------------------------------

44. භරත නාට්‍යයම්හි ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය සහ වාදනය කරනු ලබන ගුරුවරයා හඳුන්වන නාමය කුමක්ද?

i) තාල වාද්‍ය භාණ්ඩය -----------------------------------------------

ii) ගුරුවරයා -----------------------------------------------

45. පහත ඡායාරූපයේ දැක්වෙන රංග කලාව සහ එහි සපත්තු විශේෂය නම් කරන්න.



i) රංග කලාව ------------------------------------------------

ii) සපත්තු විශේෂය ------------------------------------------------

47. "ඒ වෛදේහ රජුගේ විධානයෙන් ආතත විතත විතතාතත ඝන සුසිර යන තූර්ය නාද පැවැත්වූහ" යනුවෙන් දැකවෙන කෘතිය සහ යුගය නම් කරන්න.

i) කෘතිය ------------------------------------------------

ii) යුගය ------------------------------------------------

48. දවුල් කඩිප්පු සැකසීම සැඳහා යොදා ගනු ලබන ලී වර්ග 2ක් නම් කරන්න.

i) ------------------------------------------------ ii) ------------------------------------------------

49. අතීතයේ ශාන්තිකර්ම රංග භූමිය ආලෝක කරණය සඳහා භාවිත කළ විධික්‍රම 2ක් සඳහන් කරන්න.

i) ------------------------------------------------ ii) ------------------------------------------------

50. අද්‍යතනයේ විකාශනය වන රූපවාහිනී නර්තන වැඩසටහන් 2ක් දක්වන්න.

i) ------------------------------------------------ ii) ------------------------------------------------